**හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව - 2020**

-----------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (අ) ඡේදයේ නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වර්තාවේ පෙන්වා දුන් 1.2.1 (අ),(ඉ),(ඊ) දරණ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ඉකුත් වර්ෂයේ ඉටු නොකරන ලද වටිනාකම රු.1,200,000 ක් වූ ව්‍යාපෘති 24 ක් ඉටු කළ ලෙස සළකා ගැලපීම් කිරීම හේතුවෙන්, කර්මාන්ත ණයහිමියෝ සහ සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි . | නිරීක්ෂණය පිළිගන්නා බව දන්වා ඇත. | වැරදි හඳුනාගෙන ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයන් 06 කට අදාළ එකතුව රු.9,762,054 ක් වු ශේෂ හා ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.569,709 ක අසමානතා පැවතුණි. | උප ලේඛනයේ ඇති වූ දෝෂ හා , ශේෂය සොයාගත නොහැකි වූ බවත් ඉදිරි ගිණුම්වලදී නිවැරදි කර ගන්නා බවත් දන්වා ඇත. | නොසැසඳීම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම.**

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.2,842,059 ක් වූ ගිණුම් ශේෂ 07 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් ප්‍රකාශවලදී නිවැරදි කර ගන්නා බව දන්වා ඇත. | උපලේඛන නිසි ලෙස නඩත්තු කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,972,042 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,517,554 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | 2020 ජනවාරි 01 දිනට රු.1,667,956 ක හිඟ වරිපනම් බදු පැවති අතර, දෙසැම්බර් 31 දිනට අය කිරීම්වල එකතු වටිනාකම රු.563,028 ක් වූයෙන් ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය දුර්වල මට්ටමක පැවතුණි. | ඉදිරියේදී අයකර වාර්තා කරන බව දන්වා ඇත. | ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | **කුලී** | | |
| | හඟුරන්කෙත පොදු වෙළඳපොළ සංකීර්ණයේ කඩ කාමර 12 කින් වසර 04 සිට 09 දක්වා කාලයක් තිස්සේ පැවත එන රු.2,214,537 ක හිඟ කඩ කුලී අය කර ගෙන නොතිබුණි. සන්තකය පවරා ගැනීමට ලිපිගොනු සකස් කිරීම පමණක් සිදුකර තිබුණි. | නිත්‍යානුකූලව සන්තකය පවරා ගැනීමට නඩු පැවරීම සඳහා ලිපි ගොනු සකස්කර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට 2020 පෙබරවාරි 05 වන දින භාරදී ඇත. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතු වීම. |

**(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.87,289 ක් හා මුද්දර ගාස්තු රු.15,733,922 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය පිළිගන්නා බව දන්වා ඇත. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජොන්ස්ලන්ඩ් මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 2018 වර්ෂයේ දී තැන්පත් ගිණුමට බැර කර තිබූ රු.800,000 ක තැන්පත් මුදල අදාළ කාර්යයන් සිදු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ඇස්තමේන්තුවට අනුව ප්‍රතිසංස්කරණ කටයුතු කිරීමට මෙම මුදල ප්‍රමාණවත් නොවන බැවින් මුදල් ලැබුණු පසු ප්‍රතිසංස්කරණ කටයුතු කිරීමට කටයුතු යොදා ඇත. | ප්‍රතිපාදන උපරිම අයුරින් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සභා බල ප්‍රදේශයේ ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අයදුම්පත්‍ර 85 ක් ලැබී තිබුණු අතර, ඉන් 45 ක් සඳහා පමණක් ගොඩනැගිලි අවසරපත්‍ර නිකුත් කර තිබුණි.ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමැතිය ලබා දීමට මාස 1 සිට මාස 6 දක්වා ප්‍රමාදවීමත් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාල අධීක්ෂණ වාර්තාව මාස 1 සිට මාස 11 ක කාලයක් ප්‍රමාද වීමත් හේතුවෙන් අවසර පත්‍ර නිකුත් කිරීම ප්‍රමාද වී පැවතුණි. | ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර අඩුපාඩු සම්පූර්ණ කර නොගැනීම නිසා මෙසේ වී ඇත. | කාර්යක්ෂමව කාර්යයන් ඉටු කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂය රු.3,463,177 ක් වූ අතර, ඉන් රු.408,733 ක් වසරක කාලයක් ඉක්මවා අය විය යුතුව පැවැතුණි. | අවශ්‍ය තොරතුරු හා මුදල් ලබාගැනීමට අදාළ ආයතනවලට ලිඛිතව හා වාචිකව දැනුම් දුන්නද මේ වන තෙක් සභාවට ලැබී නැත. | ණයගැති ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි ගිණුමේ ශේෂය රු. 10,580,098 ක් වූ අතර ඉන් රු.2,240,984 ක් 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලයක සිට පැවත එන ශේෂයක් වුව ද, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරමි. | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පරිසර කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වදගම අස්පන්තිය සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ඇති ගොඩනැගිල්ල නිෂ්ක්‍රීයව පැවතුණි. | මේ වන විට කොම්පෝස්ට් සැකසීම සඳහා යන්ත්‍ර සවිකර ඇති අතර, ඉදිරියේදී කොම්පෝස්ට් නිෂ්පාදනයට කටයුතු කිරීමට සුදානම්කර ඇති බව. | වත්කම් ඵලදායීව උපයෝජනය කිරීමට පියවරගත යුතු වීම. |